Sri Lanka Journal of Co-operative studies, Volume 02, Issue 01, 2022
ISSN- 2579-1745, pp. 86–102.

සමුපකාර ග්‍රාමීය බැංකු විසින් ණය නිකුත් කිරිමේ ක්‍රියාවලිය ණය අකාර්ය වීම කෙරෙහි සිදු කරනු ලබන බලපෑම

එච්.ලලිත් කුමාර[1]
එස්.එන්. මුදන්නායක[2]

[1] සමුපකාර සංවර්ධන නිළධාරි, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
[2] කථිකාචාර්ය, උසස් තාක්ෂණික ආයතනය, මහනුවර

සංක්ෂේපය

සාමාජිකත්වයට ණය සැපයීම උදෙසා 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත මඟින් සමුපකාර ව්‍යාපාරයට ණය නිකුත් කිරිමේ බලය ලැබී ඇත. නමුත්, බහුතරයක් සමුපකාර ග්‍රාමීය බැංකු හා සණස සමිති වලින් සාමාජික ප්‍රජාව වෙත නිකුත් කර ඇති ණය අකාර්ය වීම (කල්පසු) ප්‍රධාන ගැටළුවක් බවට පත්වී ඇත. සමුපකාර ග්‍රාමීය බැංකු විසින් ණය නිකුත් කිරිමේ ක්‍රියාවලිය ණය අකාර්යවීම කෙරෙහි සිදු කරනු ලබන බලපෑම විමසා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මහනුවර දිස්ත්‍රික්කයේ ගඟසිරිපුර කලාපයේ පිහිටි සී/ස ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය සහ ගඟ ඉහල කෝරලේ විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශ වලට අයත් ග්‍රාමීය බැංකු 30 කට අයත් ණය නිළධාරින් 84 දෙනෙක් සම්බන්ධ කරගනිමින් පර්යේෂණය දියත් කරන ලදි. සාහිත්‍යය විමර්ශනය මඟින් පර්යේෂකයා ණයකරුවන්ගේ ඉතිහාසය, ප්‍රාග්ධනය, ණය මුදල, ණය ගැනීමේ වාර ගණන, ණය ප්‍රතිලේඛන ගත කිරීම, ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රමවේදය පිළිබඳව පුළුල් ලෙස අධ්‍යයනය කරන ලදි. ඒ අනුව, ණය තක්සේරු ක්‍රියාවලිය විධිමත් නොවීම නිසා අකාර්ය ණය ප්‍රමාණය වැඩි වන බව සාහිත්‍යය විමර්ශනයේදී අනාවරණය විය. එම දත්ත මත එය තක්සේරු ක්‍රියාවලියට බලපාන උපසාධක ලෙස ඉතිහාසය, ප්‍රාග්ධනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ආදායම් මට්ටම, ණය මුදල හා ණය ගෙවීමේ වාර ගණන හඳුනා ගන්නා ලදි. ණය අක්‍රීය වීමට සහ මූල්‍ය තිරසාර බවට බලපාන උපසාධක ලෙස බොල්ණය, කල්පසු ණය වාරික ප්‍රමාද වී ගෙවීම, ණය ප්‍රතිලේඛනගත කිරිම, ද්‍රවශීලතාවය අඩුවීම හා ආදායම අඩුවීම ලෙස හඳුනාගන්නා ලදි. සාහිත්‍යය විමර්ශනයේදී සොයාගත් කරුණු මත පර්යේෂකයා විසින් උපන්‍යාසය 06 ක් ගොඩනඟා ගත් අතර ඒවා අනුපිළිවෙලින් පහත පරිදි දැක්විය හැක. ණයකරුවන්ගේ ඉතිහාසය පිළිබඳ කරුණු විමසීමක් නොකිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපායි. (H_1), ණයකරුවන්ගේ ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරීම නිසා ණය අකාර්ය වීමට ධනාත්මකව බලපානු ලබයි. (H_2), ණයකරුවන්ගේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධව අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපායි. (H_3) ණය කරුවන්ගේ ආදායම් මට්ටම පිළිබඳ අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපානු ලබයි. (H_4), ණයකරුවන් වෙත ප්‍රදානය කළයුතු ණය මුදලේ ප්‍රමාණය තීරණය නොකර ණය ප්‍රදානය කිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපායි. (H_5) ණය තක්සේරු කරන සමස්ථ ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරිම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපානු ලබයි. (H_6). මෙම පර්යේෂණය ක්ෂේත්‍ර අධ්‍යයන සැලැස්මක් මත සිදු කරනු ලැබූ ගවේෂණාත්මක අධ්‍යයනයකි. අධ්‍යනය

සඳහා සී/ස ගම්පොල විවිධ සේව සමුපකාර සමිතිය, සී/ස ගඟ ඉහල කෝරලේ විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශවල පිහිටා ඇති ග්‍රාමීය බැංකු 30 ක් තෝරා ගන්නා ලදී. සංගණනය ග්‍රාමීය බැංකු ශාඛා 30 ක සේවයේ යෙදී සිටින බැංකු කළමනාකරුවන්, කළමනාකරණ සහයකයන්, කාර්යාල සහයකයන්ගෙන් සමන්විත වේ. නියැදිය ලබාගැනිමේදී පොකුරු නියැදි ක්‍රමය භාවිතා කරන ලද අතර බැංකු කළමනාකරුවන් 30 ක් නියැදිය සඳහා තෝරා ගන්නා ලදි. පර්යේෂක විසින් සංකල්පීය රාමුව ගොඩනඟනු ලැබූ අතර, එහි පරායත්ත විචල්‍යය ලෙස මූල්‍ය තිරසාර බව හඳුනා ගන්නා ලදි. ස්වායත්ත විචල්‍යය ලෙස ණය තක්සේරු ක්‍රියාවලිය හඳුනාගන්නා ලද අතර, එහි උප විචල්‍යයන් ලෙස ඉතිහාසය, ප්‍රාග්ධනය, ණය මුදල්, ආදායම් මට්ටම, මුදල් ප්‍රමාණය සහ ණය ගැනීමේ වාර ගණන සලකා බලන ලදි. දත්ත විශ්ලේෂණයේදී තෝරාගත් නියැදියෙන් 68% ක් ස්ත්‍රීන්ද , 32% ක් පුරුෂ ද බව අනාවරණය විය. තවදුරටත්, නියැදියෙන් 68% ක් විවාහක පුද්ගලයින්ද, 32% ක් අවිවාහක පුද්ගලයින් බව අනාවරණය විය. තවදුරටත්, විශ්ලේෂණය කිරිමේදී නියැදියෙන් 48% ක් වයස අවුරුදු 20-30 අතර, පුද්ගලයන්ද 52% ක් වයස අවුරුදු 40-60 අතර, පසුවන බව හෙළිදරව් විය. සේවා කාලය අවුරුදු 1-10 අතර 28% ක් ද අවුරුදු 11-20 අතර, 36% ක්ද නියැදිය තුල සිටී. නියැදියේ මාසික ආදායම සලකා බලන කළ මාසික ආදායම රු.25,000 අඩු පුද්ගලයින් 13 ද (52%) රු.25,000/- ට වැඩි පුද්ගලයින් 12 (48%) ද සිටින බව අනාවරණය විය. දත්තවල විශ්වාසනීය බව cronbach's alpha *සංගුණය මඟින් ගණනය කරනු ලැබූ අතර, සියළුම අයිතම සඳහා අගය 0.7 වඩා වැඩි අගයන් ලැබී තිබුණි. ඒ අනුව, දත්ත විශ්වාසදායී ලෙස විශ්ලේෂණය කළහැකි බව තහවුරු විය. විචල්‍යයන් අතර, සහ-සම්බන්ධතාවය පියර්සන් සහසම්බන්ධතාවයෙන් මිණුම් කරනු ලැබූ අතර, සියළු ස්වායත්ත විචල්‍යයන් පරායත්ත විචල්‍යයට සහසම්බන්ධතාවයක් දක්වන බව සාධනය විය. ඉහත දත්ත විශ්ලේෂණය මඟින් සංකල්පනාත්මක රාමුව මඟින් ගොඩනඟා ඇති උපන්‍යාසයන් එනම්, ණය තක්සේරු ක්‍රියාවලිය නිවැරදි නොවන නිසා එය ණය ආකාර්ය වීමට සෘජුවම බලපාන බව තහවුරු විය. එම නිසා අහිතකර ණය ප්‍රතිශතය වැඩිවීම නිසා පොලී ආදායම අඩුවිම තුලින් මූල්‍ය තිරසාරභාවය එනම්, කාරක ප්‍රාග්ධනය ඌනා වීම සහ ද්‍රවශීලතාවය හීනවන බව ප්‍රකාශ කළ හැක. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව පර්යේෂක විසින් පහත නිර්දේශ ලබාදෙනු ඇත. ණය අවශ්‍යතාවය අනුව ණය වර්ග කිරීම, ආපසු ගෙවන කාලය අනුව ණය වර්ග කිරීම ණය නිකුත් කිරිම පියවර ක්‍රමයට සිදු කිරීම ඒ අතුරින් ප්‍රමුඛ වේ. ඉදිරි පර්යේෂණ සඳහා නියැදිය වැඩිකර පළාත් කිහිපයක මෙම අධ්‍යයනය සිදු කිරීමට පර්යේෂක නිර්දේශ කරයි.*

මූල පද: *ණය ක්‍රියාවලිය, තක්සේරු ක්‍රියාවලිය,අකාර්ය ණය, මූල්‍ය තිරසාර බව*

1. හැඳින්වීම.

සමුපකාර ව්‍යාපාරය ලෝක පරිණාමයෙන් ආරම්භ වන්නේ ධනවාදයේ නැගිම මත සිදු වු ව්‍යසනකාරි තත්වයන් සඳහා මුහුණ දීමට ධනවාදයේ තිඹිරි ගෙවල් ලෙස කටයුතු කල රටවලින් මතුවු මහජන ව්‍යාපාරයක් වශයෙනි. අපට තනි තනිවම මුහුණ දීමට සිදුවන ජීවන අභියෝග සාමූහිකව කණ්ඩායම් ගතවීම තුලින් විසඳා ගැනීමට සමුපකාරය උපකාරී වේ. සමුපකාර සමිති නිර්මාණය වීම එහි ප්‍රතිඵලයක් වේ. පහල, මධ්‍යම පාන්තික හා අඩු ආදායම්ලාභී ග්‍රාමීය හා නාගරික ජනතාවට වාණිජ බැංකු හා වෙනත් සංවර්ධන බැංකු විසින් ණය ලබාදීම සඳහා ඉල්ලුම් කරන සුරැකුම් ලබා දීමට හැකියාවක් නොමැති නිසා එම බැංකු වලින් ඈත් වී ඉහත කී ප්‍රජාවට විකල්පයක් වශයෙන් සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති (සණස) බිහි වී ඇත. ඊට අමතරව විවිධ සේවා සමුපකාර සමිතිවලට අනුබද්ධව ග්‍රාමීය බැංකු අංශයක් පිහිටුවා ඒ ඒ විවිධ සේවා සමුපකාර සමිතිවල බලප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් ග්‍රාමීය බැංකු ශාඛා පිහිටුවා ඇත. සණස සමිති හා ග්‍රාමීය බැංකුවල මූලික කාර්යය වුයේ මහජනතාවගේ තැන්පත් භාරගැනිම හා ණය නිකුත් කිරිමයි. ඒ අනුව, සමුපකාර ග්‍රාමීය බැංකු සහ සණස සමිති වලින් සාමාජික ප්‍රජාව වෙත නිකුත් කර ඇති ණය අකාර්ය වීම (කල්පසු) වර්තමානයේ ප්‍රධාන ගැටළුවක් වී ඇත. 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත මඟින් සමුපකාර ව්‍යාපාරයට අමතරව වෙනත් බාහිර ආයතනවලට ග්‍රාමීය ජනතාවගේ මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ණය නිකුත් කිරිමේ බලය ලැබී ඇත. සමුපකාර ග්‍රාමීය බැංකුවල ගණුදෙනුකරුවන්ද ඉහත කී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් මඟින් ණය ලබා ගැනීමට වැඩි ප්‍රවණතාවයක් වර්තමානයේ දක්නට ඇත. එම ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ඉතා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම සහ නූතන අලෙවිකරණ උපාය මාර්ග හා කළමනාකරණ දැනුම ද සමාජ විද්‍යා දැනුම ද උපයෝගී කරගෙන සන්නද්ධ සංවිධානයක් වශයෙන් ප්‍රජාව තුලට ඇතුලත් වීම නිසා සණස සමිති සහ ග්‍රාමිය බැංකුවලට විශාල අභියෝගයක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ග්‍රාමීය බැංකු හා සණස සමිතිවලින් නිකුත් කරන ණය අකාර්ය විම දක්නට ලැබේ. සමුපකාර ග්‍රාමීය බැංකු මඟින් ණය නිකුත් කිරිමේ ක්‍රමය මඟින් ණය අකාර්ය වීමට කොපමණ දුරට බලපෑමක් සිදුකර තිබේද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මීට අමතරව ණය නිකුත් කිරීමේ ක්‍රියාවලිය සැළකිය යුතු සම්බන්ධතාවයක් ඇති බව ද හඳුනා ගැනීම හා අනාගත ණය ගැනුම්කරුවන්ගේ ණය සුදුසුකම් තීරණය කිරිමේ යාන්ත්‍රණයක් හඳුනා ගැනීම සහ දැනට ක්‍රියාත්මක ණය ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට අවශ්‍ය නිගමන හා නිර්දේශ ලබාදීමට ද මෙම අධ්‍යයනය මඟින් පර්යේෂකයා අපේක්ෂා කරනු ලබයි. අධ්‍යනයේ පසුබිම (Background of the Study) විස්තර කිරීමේදී, විවිධ සේවා සමුපකාර සමිතිවල ග්‍රාමීය බැංකු අංශය මඟින් ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික සංවර්ධනය සඳහා දක්වන දායකත්වය පිළිබඳව අවධානය යොමු කරන ලදි. එමෙන්ම, සමුපකාර සමිතිවල වර්තමානයේ සක්‍රීයව ක්‍රියාත්මක වන ග්‍රාමීය බැංකු විසින් ග්‍රාමීය ජනතාවගේ ණයගැතිභාවය අවම කිරීම සඳහා දක්වා ඇති දායකත්වය ප්‍රමාණවත් ද යන්නත් අධ්‍යනය කරනු ලබයි. මෙම පර්යේෂණය සිදු කරනු ලබන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ සිරිපුර කලාපයේ පිහිටි සීමා සහිත ගම්පොල විවිධ සේවා සමුපකාර සමිතිය, සීමා සහිත නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිතිය සහ ගඟ ඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශවලට අයත් ග්‍රාමීය සමුපකාර බැංකු ශාඛා 30 ට අයත් ණය නිලධාරීන් 84 දෙනෙක් සම්බන්ධ කර ගෙනය. එමෙන්ම, සමුපකාර සමිතිවලට අනුබද්ධව ග්‍රාමීය බැංකු ශාඛා ව්‍යාප්ත

වීම, බලප්‍රදේශයේ ජනගහනය, ණයදෙනුකරුවන්ගේ රැකියාව, ආදායම් තත්වය පිළිබඳව අවධානය යොමු කිරීම තුලින් පර්යේෂණ ගැටලුවට විසඳුමක් සොයා ගැනීමට ද පර්යේෂකයා අපේක්ෂා කරනු ලබයි. ග්‍රාමීය බැංකු අංශයේ අවධානම් කළමනාකරණය සඳහා අනුගමනය කර ඇති ප්‍රතිපත්ති කෙසේ ද? එම ප්‍රතිපත්ති ව්‍යාපාරය විසින් කෙතෙක් දුරට ග්‍රහනය කරගෙන තිබේද යන්න ද, නිකුත් කර ඇති ණය අයකර ගැනීම සම්බන්ධව වර්තමානයේ උද්ගත වී ඇති ගැටළු හඳුනා ගැනීම හොඳ ණය කරුවන් තීරණය කිරීම සඳහා උපයෝගී කරගෙන ඇති ණය ප්‍රතිපත්ති සම්බන්ධවද අවධානය යොමුකර ඇත.

පර්යේෂණ ගැටළුව

විවිධ සේවා සමුපකාර සමිතිවලට අනුබද්ධ ග්‍රාමීය බැංකු ණය නිකුත් කිරීමේ ප්‍රතිපත්ති එම ණය අකාර්ය වීමට සිදු කරනු ලබන බලපෑම කොතෙක් ද?

පර්යේෂණ අරමුණු

ප්‍රධාන අරමුණ

විවිධ සේවා සමුපකාර සමිතිවලට අනුබද්ධ ග්‍රාමීය බැංකු ණය නිකුත් කිරීමේ ප්‍රතිපත්ති එම ණය අකාර්ය වීමට සිදු කරනු ලබන බලපෑම අධ්‍යනය කිරිම.

උප අරමුණු

1. ණයකරුවන්ගේ ඉතිහාසය හඳුනා ගැනීම තුලින් ණය අකාර්ය වීමට බලපාන අකාරය හඳුනා ගැනීම.
2. මූල්‍ය තත්වය අධ්‍යයනය කර ණය වාරික ගෙවීමට ඇති හැකියාව සම්බන්ධව කරුණු සොයා බැලීම.
3. ලබා ගන්නා ණය මුදල කුමන කාර්යකට යොදවනවා ද, එම ණය මුදල මඟින් ඔහුගේ ආර්ථිකයට සිදුවන බලපෑම කොපමණ ප්‍රමාණයක් ද, යන්න සලකා බැලීම.

අධ්‍යනයේ සීමා

ඉහත අධ්‍යනය සිදුකිරීමේ දී, පර්යේෂකයාට පාලනය කළ නොහැකි සීමාවන් කිහිපයක් හඳුනාගන්නා ලදි. අධ්‍යයනය සිදුකර ඇත්තේ මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පරිපාලන ඒකකයක් වශයෙන් නම් කර ඇති ගඟ සිරිපුර කලාපයේ විවිධ සේවා සමුපකාර සමිති තුනක් පදනම් කොටගෙනය. ශ්‍රී ලංකාව ගත් විට සමිති 343 ක් පවතින නිසා ඉතා කුඩා නියැදියක් වීම ජාතික මට්ටමේ තීරණ ගැනිමේ දී ප්‍රමාණවත් නොවීම. ඊට අමතරව වතු සේවක නිවාස සමුපකාර සමිති, ආයතනික සණස සමිති, ප්‍රාග්ධන සමුපකාර සමිති අධ්‍යාපන සමුපකාර සමිති, වැනි මූල්‍ය ආයතන මඟ හැර ඇති බවද තවත් සීමාවකි.

2. සාහිත්‍ය විමර්ශණය

කල්පසු වු ණය

ණය කල්පසුවීම යනු ණය වාරිකයේ නියමිත දිනට නොලැබීමයි. ණය ලාභින් විසින් ණය ලබාගත් පසු මාසික ණය වාරිකය ගෙවීමට උනන්දුවක් නොමැතිකම මෙම තත්වයට සෘජුවම බලපා ඇත. (රාජන්, 1994). කල්පසු ණය ප්‍රතිශතය ඉහළ යෑම නිසා බැංකුවල ද්‍රවසීලතාවයට බලපෑමක් ඇතිවන බවත් පොලී ආදායම නියමිත කාලය තුළ නොලැබීම නිසා තාවකාලික පසුබෑමකට පත්වන බවත් වීරසේකර (2020), යන ලිපියෙන් ද සනාථ කර ඇත. එමෙන්ම, ණයකරුවන් විසින් ණය ගිවිසුමට අනුව නියමිත දිනයේ මාසික ණය වාරිකය නොගෙවීම නිසා බැංකුවල මූල්‍ය දර්ශකය පහත වැටීමට සෘජුව බලපානු ලබයි. ණය කළඹේ ගුණාත්මකභාවය පහත වැටීමට ද මෙය හේතුවක් වේ. (රත්නසීල, 2018). අක්‍රීය ණය අනුපාතය 20% කට වැඩි වුවහොත් එය ඉතා නරක තත්වයක් බව 2020 බැංකු නියාමක සම්බන්ධ ජාතික ඒකකය මඟින් නිකුත් කර ඇති උපදෙස් වලද සඳහන් කර ඇත. බැංකුවල අක්‍රීය ණය සම්බන්ධව 1991-2015 කාලය තුළ බාබඩෝස් අනුභාවිත ප්‍රතිඵල වලින් පෙන්නුම් කරන්නේ අක්‍රීය ණය අනුපාතය ඉහළ යාම නිසා කොටස් මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ, තැන්පතු මත ණය අනුපාතය වැනි දර්ශක හිතකර තත්වයක් නොපෙන්වන බව සඳහන් කර ඇත. තවදුරටත් සඳහන් කිරීමේදී, ජයමහ සහ මුලන් (2010), උපුටා දක්වන්නේ සමුපකාර ග්‍රාමීය බැංකු වල ණය කල්පසු වීම සඳහා ණය කරුවන්ගේ ඉතිහාසය, ප්‍රග්ධනය, ණය මුදල තීරණය කිරීම, ණය කරුවන්ගේ මුදල් ප්‍රවාහය, අදායම් මට්ටම, ණය මුදල, ණය ගැනීමේ වාර ගණන, බොල් සහ අඩමාන ණය, ණය ප්‍රතිලේඛණ ගත කිරීම යන සාධක බලපාන බව සඳහන් කර ඇත. බැංකුවල මූල්‍ය ශක්තිය හීන වීම නිසා කාර්ය සාධනය අඩුවීම සහ අලාභ තත්ත්වයට පත්වන බව රාජන් (1994), සඳහන් කර ඇත.

ග්‍රාමීය බැංකු හා ක්ෂුද්‍ර මූල්‍ය අතර සම්බන්ධය

විශේෂයෙන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන වටා එකරාශී වී ඇති බොහෝ ගණුදෙනුකරුවන් නාගරික හා ග්‍රාමීය වශයෙන් කොටස් දෙකකට වෙන් කල හැකිය. එම ගණුදෙනු කරුවන් අතර ස්වයං රැකියා නියුක්තිකයන්, අඩු ආදායම් ලාභී ව්‍යවසායකයින්, වෙළෙන්දන්, වීදි වෙළෙන්දන්, කුඩා ගොවිපල වෙළෙන්දන්, කරනවෑමින්, කුලී රථ කරුවන්, කම්මල්කරුවන්, රං කරුවන්, ඇඳුම් මසන්නන් ආදීන්ගෙන් සමන්විත වේ. 2016 වර්ෂයේ අංක 6 දරණ ශුද්ධ මූල්‍ය පනත සම්මත වූ පසු රටපුරා විවිධ ශුද්ධ මූල්‍ය සමාගම් ක්‍රියාත්මක වී ඇත. ග්‍රාමීය ජනතාව තුළ එතෙක් ප්‍රචලිතව පැවති අවිධිමත් පොලියට ණය ලබාගත් පුද්ගලයන් මෙම ශුද්ධ මූල්‍ය සමාගම වටා ඒකරාශී වී ඇත. (බුලත්ගම, 2014), තවද, මෙම සමාගම් වලට බඳවාගෙන ඇති ණය නිළධාරින් ගමට පැමිණ කුඩා සමිති පිහිටුවා ඒ තුළ සමාජිකයන් පස් දෙනා බැගින් කණ්ඩායම් සකස් කර එක් අයෙකුට රුපියල් ලක්ෂය දක්වා ණය මුදල් ඉතා කෙටි කාලයක් තුළ ලබා දෙනු ලැබේ. ඒ සඳහා අධික පොලී අනුපාතයක් නියම කිරීමත්, ණය ආපසු ගෙවීම සඳහා සති වාරික නියම කිරීම පොලිය ගණනය කිරීමට අවිධිමත් ක්‍රම භාවිතා කරන බව ද අණාවරණය වේ. (රත්නසීල, 2018). ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවිය අනුව ක්ෂුද්‍ර මූල්‍ය ණය යනු අඩු ආදායම් ලාභී හෝ ණයක අවශ්‍යතාවය පවතින එහෙත් ආදායම් මාර්ග පෙන්වීමට හැකියාවක් නැති ණය ආපසු ගෙවන ක්‍රමය පෙන්වීමට නොහැකිකම හෝ ඇප කරුවන් සම්බන්ධ ගැටලු නිසා විධිමත් බැංකුවකින් ණය ලබා ගැනීමට නොහැකි අයට ණය මුදල් ලබා ගැනීම සඳහා සකස් කෙරෙන ක්‍රමවේදයකි. ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන ආයතන නියාමනය කිරීමට 2016 අංක 6 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත සම්මත කර ඇත. එම පනතට අනුව වාර්ෂික පොලී අනුපාතය 35% විය යුතුය. නමුත්, මෙම ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් 20% සිට 220% දක්වා අධික පොලී අනුපාත ක්‍රියාත්මක කරන බව ඒ සම්බන්ධව පැවති නඩු වලදී

නීතිඥ මහතුන් විසින් ප්‍රකාශ කර ඇත. 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනත හා එයට සමගාමීව සම්මත වී ඇති පළාත් සමුපකාර ප්‍රඥප්තිය යටතේ පිහිටුවා ලියාපදිංචි කර ඇති විවිධ සේවා සමුපකාර සමිති හා සකසුරුවම් හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති (සණස), ආයතනික සමුපකාර සමිති, ප්‍රාග්ධන සමුපකාර සමිති, වතු නිවාස සමුපකාර සමිති, අනුබද්ධ බැංකු කටයුතු කරන විවිධ සේවා සමුපකාර සමිති යටතේ ඇති සමුපකාර ග්‍රාමීය බැංකු ද, ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු කරන බව පෙනී යයි. විශේෂයෙන් මෙම මූල්‍ය ආයතන මධ්‍යම රජයේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා පළාත් සංවර්ධන සමුපකාර දෙපාර්තමේන්තුව මඟින් නියාමනය කරනු ලබයි. (බුලත්ගම, 2014). රොච්ඩේල් පුරෝගාමීන්ගේ පළමු සාර්ථක සමුපකාර සමිතිය ගත්විට එයද ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ සම්බන්ධතාවයක් ඇති බව ඉතිහාසය අනාවරණය කරයි.

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය ආරම්භය වන්නේ සමුපකාර ව්‍යාපාරය තුළිනි. 1911 සමුපකාර ආඥා පනත යටතේ පිහිට වූ ණය දෙන සමුපකාර සමිති මූලිකත්වය ගත් බව හෙළිදරව් වේ. (බුලත්ගම, 2014). නිදහසින් පසු එනම්, 1950 ගණන් වලදී දුප්පත් ජනතාවට ණය ලබා ගැනීමට තිබූ අපහසුතාවය ගැන සලකා 1963 සමුපකාර ග්‍රාමීය බැංකු සමිති ක්‍රියාත්මක වී ඇත. එම බැංකු සමිති අතර සී/ස මැණික්හින්න සමුපකාර ග්‍රාමීය බැංකු සමිතිය, සී/ස පලාපත්වල සමුපකාර ග්‍රාමීය බැංකු සමිතිය, සී/ස පොල්ගහවෙල සමුපකාර ග්‍රාමීය බැංකු සමිති යන බැංකු සමිති විශේෂයෙන් සඳහන් කළ යුතුය. 1972 වර්ෂයේ දී සමුපකාර ප්‍රතිසංවිධානයේ දී එවකට තිබූ කුඩා කඩ සමිති ඒකරාශි කර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පදනම් කරගෙන විවිධ සේවා සමුපකාර සමිති ආරම්භ කරන ලදි. එම විවිධ සේවා සමිතිවල අංශයක් වශයෙන් සමුපකාර ග්‍රාමීය බැංකු ආරම්භ කරන ලදි. මෙම සමුපකාර ග්‍රාමීය බැංකු මඟින් බල ප්‍රදේශයේ සමාජික ජනතාවට ක්ෂුද්‍ර මූල්‍ය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා විශාල දායකත්වයක් ලබාදී ඇත. වර්තමානයේ දී ශ්‍රී ලංකාව පුරාම ග්‍රාමීය බැංකු ශාඛා 1300 කට ආසන්න ප්‍රමාණයක් පිහිටුවා ඇත. (සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, 2018). ඒ අනුව, දශක 06 ට ආසන්න අතීතයක් ඇති සමුපකාර ග්‍රාමීය බැංකු ක්‍රමය ජනතාවගේ ඉතුරුම් රැස්කර ග්‍රාමීය අංශයේ සංවර්ධනය සඳහා දායකත්වය ලබාදෙන අරමුණින් ක්‍රියාත්මක වන ජනතාවදී ආර්ථික හා සමාජීය ව්‍යාපාරයක් බව පර්යේෂකයා සඳහන් කරයි. තිලකරත්න සහ වික්‍රමසිංහ (2019), පෙන්වා දෙන්නේ ක්ෂුද්‍ර මූල්‍ය ශ්‍රී ලංකාවේ ප්‍රජාවට වැදගත් මෙහෙයක් කරන බවයි. මේ අනුව, මධ්‍යම මට්ටමේ ප්‍රජාවට ඔවුන්ගේ ආදායම් හා වත්කම් ඉහල නංවා ගැනීමට ද වඩා දුප්පත් අයගේ පාරිභෝගික වියදම් සුමට කිරීමට එය උපකාරි වන බව සඳහන් කරයි. බැංකු ණයවල ගුණාත්මකභාවය පිරිහීම නිසා මූල්‍ය දුර්වලතාවයන්ට එය හේතුවක් බවත් එම නිසා, අතීතයේ අහිතකර ණය වේගයෙන් වැඩිවීම මත බැංකුව ස්ථායිතාවයට එය බලපා ඇති බව කැන්ට් සහ ඩෙමැජියාවේ (1998), ප්‍රකාශ කර ඇත. සාමාන්‍යයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල ණය පැහැර හැරීමට හේතු වන්නේ ණය ලබාගැනීමේ දී විවිධ හේතු ඉදිරිපත් කරන බවත් එම හේතු සම්බන්ධව විපරම් නොකිරීම නිසා, අකාර්ය ණය වැඩි වීමට හේතුවක් බව සොනාලි (2001), පවසා ඇත. බැංකු ශාඛාවල ණය නොගෙවීම අඛණ්ඩව මාස 03 (දින 90) ක් ගත වූ පසු එම ණය කරුවන් අකාර්ය ණය කරුවන් (කල්පසු ණයකරුවන්) වශයෙන් තීරණය කරනු ලබන බව පැසන් සහ ඇල්ටන් (2001), ප්‍රකාශ කර ඇත. ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන බැංකුවල ණය පැහැර හැරීමේ සීඝ්‍ර

වර්ධනයක් දක්නට ඇති බව ක්‍රිටන් (1999), ප්‍රකාශ කර ඇත. මෙම තත්වය මගහැරීම සඳහා ණය දීමේ සීඝතාවය වැඩි කිරීම නිසා කල්පසු ණය ප්‍රතිශතය අඩුවී ඇති බව සොරිනා (2002), ප්‍රකාශ කර ඇත. බැංකු විසින් ඉහල පොලී අනුපාතයක් අය කිරීම නිසා ණය කරුවන්ට ණය වාරික ගෙවීමට නොහැකි වීම නිසා අකාර්ය ණය ගොඩ වැඩි වී ඇත. මේ සම්බන්ධව රාජන් සහ ෂනල් (2003), ප්‍රතිගාමී විශ්ලේෂණයක් මඟින් තහවුරු කර ඇත. කෙන්යාවේ වාණිජ බැංකු විසින් සංඛ්‍යාත්මක විශ්ලේෂණයක් භාවිතා කරමින් පෙන්වා ඇත්තේ ඉහළ පොලී අනුපාතයක් අය කිරීම නිසා බැංකුවල අකාර්යක්ෂම ණය ප්‍රමාණය වැඩි වීමට හේතුව බවත් එය බැංකුවල අභ්‍යන්තර සාධකයක් වන බවද එක්සත් ජනපදයේ බර්ගර් සහ ඩියුං (1997), ප්‍රකාශ කර ඇත. ඒ අනුව, ණය තක්සේරු ක්‍රියාවලිය විධිමත් නොවීම නිසා එහි ප්‍රතිඵලය වන්නේ අහිතකර ණය එනම් අකාර්ය ණය ප්‍රමාණය වැඩි වීමයි. ඒ බව සාහිත්‍ය විමර්ශනයේ දී මනාව සාධනය වේ. ණය තක්සේරු කරන ක්‍රියාවලිය ණය අකර්ය වීමට බලපාන ආකාරය සම්බන්ධව ගොඩ නගන ලද සංකල්පනාත්මක රාමුව අනුව පහත උපන්‍යාස ගොඩනඟන ලදි. H_1- ණය කරුවන්ගේ ඉතිහාසය පිළිබඳ කරුණු විමසීමක් නොකිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපානු ලබයි, H_2- ණය කරුවන්ගේ ප්‍රාග්ධනය පිළිබඳව අධ්‍යනය නොකර ණය ප්‍රදානය කිරීම නිසා ණය අකාර්ය වීමට ධනාත්මකව බලපානු ලබයි, H_3- ණය කරුවන්ගේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සම්බන්ධව අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපායි, H_4- ණය කරුවන්ගේ ආදායම් මට්ටම පිළිබඳ අධ්‍යනය නොකර ණය ප්‍රදානය කිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපානු ලබයි, H_5- ණය කරුවන් වෙත ප්‍රදානය කළ යුතු ණය මුදලේ ප්‍රමාණය තීරණය නොකර ණය ප්‍රදානය කිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපායි, H_6- ණය තක්සේරු කරන සමස්ත ක්‍රියාවලිය පිළිබඳව අධ්‍යයනය නොකර ණය ප්‍රදානය කිරීම ණය අකාර්ය වීමට ධනාත්මකව බලපායි.

3. ක්‍රමවේදය

මෙම පර්යේෂණය ක්ෂේත්‍ර අධ්‍යන සැලැස්මක් මත සිදුකරනු ලබන ගවේෂණාත්මක පර්යේෂණයකි. ප්‍රමාණාත්මක ක්‍රමවේදය යොදාගනිමින් සංකල්පනාත්මක රාමුව මත ගොඩනඟා ඇති උපන්‍යාශයන් පරික්ෂාවට ලක්කරනු ලබයි. දත්ත එකතු කිරීම, ප්‍රාථමික හා ද්විතීයික ක්‍රම දෙකටම සිදු කරන ලදි. ප්‍රශ්නාවලි භාවිතය, සහභාගීත්ව නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, මූල්‍ය ප්‍රකාශක ඇතුළු විවිධ ලේඛන භාවිතා කිරීම, චක්‍රලේඛන නියාමනය සම්බන්ධව නිකුත් කර ඇති උපදෙස් හා පොත්පත් ආදිය පරිශීලනය මඟින් දත්ත එකතු කිරීම සිදුකරන ලදි. මහනුවර දිස්ත්‍රික්කයේ ගඟ ඉහල කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, උඩ පළාත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය යන කොට්ඨාශ බල ප්‍රදේශයන්හි පිහිටි ගඟසිරිපුර කලාපයේ සී/ස ගම්පොළ විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස ගඟඉහළ කෝරළේ විවිධ සේවා සමුපකාර සමිතිය, සී/ස නාවලපිටිය විවිධ සේවා සමුපකාර සමිති බල ප්‍රදේශවල පිහිටුවා ඇති ග්‍රාමීය බැංකු 30 ක් අධ්‍යනය සඳහා තෝරාගෙන ඇත. අධ්‍යනයේ සංගහනය ඉහතින් සඳහන් ග්‍රාමීය බැංකු ශාඛා 30 සේවයේ යෙදී සිටින බැංකු කළමනාකරුවන්, කළමනාකාරණ සහයකයින්, කාර්යාල සහයකයන්ගෙන් සමන්විත වේ. මෙම පර්යේෂණයේ දී පොකුරු නියදි ක්‍රමය පදනම් කරගෙන නියදිය තෝරාගෙන ඇත. එනම්, ග්‍රාමීය බැංකු 30 අධ්‍යනය කර ඉන් ණය නිළධාරීන් 84 න් සෑම ග්‍රාමීය බැංකුවක්ම නියෝජනය කිරීම සඳහා බැංකු කළමනාකරුවන් 30 ක නියැදියක් සඳහා තොරාගෙන ඇත. රැස්කරගත් දත්ත වගු,

ප්‍රස්ථාර, සුමට වක්‍රය, ප්‍රතිපායන රේඛා මඟින් Spss මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කර ඇත.

4. දත්ත විශ්ලේෂණය

දත්ත විශ්ලේෂණය සඳහා තෝරාගත් නියැදියේ සාමාජිකයින් 30 ක් වෙත දත්ත රැස්කර ගැනීම සඳහා ප්‍රශ්නාවලිය යොමු කරන ලදි. ඉන් 25 දෙනෙකු ප්‍රතිචාර දක්වා තිබුණි.

නියැදියේ සාමාන්‍ය තොරතුරු විශ්ලේෂණය

I. ස්ත්‍රී/පුරුෂ භාවය

වගුව 01: ස්ත්‍රී/පුරුෂ භාවය

සංකේත අංක	සංඛ්‍යාතය Frequency	ප්‍රතිශතය Percent	වලංගු ප්‍රතිශතය Valid Percent	සමුච්චිත ප්‍රතිශතය Cumulative Percent
01	17	68.0	68.0	68.0
02	08	32.0	32.0	100.00
Total	25	100.00	100.0	

N Valid	25
Missing	0
Mean	0
Median	1.32
Mode	1.00

මූලාශ්‍රය : පර්යේෂණ ප්‍රතිඵල දත්ත

මෙහිදී, අංක 01 ස්ත්‍රී වශයෙන් ද, අංක 02 පුරුෂ වශයෙන් ද, සංකේත කර ඇත. ඉහත විශ්ලේෂණයට අනුව තෝරාගත් නියැදියේ 25 දෙනාගෙන් 17 ක් ස්ත්‍රීන් ද, එහි ප්‍රතිශතය 68% ක් ද, 8 දෙනෙක් පුරුෂයින්ද එහි ප්‍රතිශතය 32% බව අනාවරණය වේ. එය වගු අංක 1 මඟින් පැහැදිලි බවත් එහි නිරූපණ අගයන් ගත්විට මාතය 1 මධ්‍යස්තය 1.32 සහ මධ්‍යය 1.00 වන නිසා දත්තවල විශ්වාසනීයභාවය තහවුරු වී ඇත. තවදුරටත්, පහත සඳහන් ප්‍රස්ථාරය මඟින් නිරූපනය කර ඇත.

රූපය 1: ස්ත්‍රී/පුරුෂ භාවය



මූලාශ්‍රය : පර්යේෂණ ප්‍රතිඵල දත්ත

II. විවාහක අවිවාහක බව

වගුව 02: විවාහක අවිවාහක බව

සංකේත අංක	සංඛ්‍යාතය Frequency	ප්‍රතිශතය Percent	වලංගු ප්‍රතිශතය Valid Percent	සමුච්චිත ප්‍රතිශතය Cumulative Percent
01	17	68.0	68.0	68.0
02	08	32.0	32.0	100.00
Total	25	100.00	100.0	

N Valid	25
Missing	0
Mean	1.32
Median	1.1
Mode	1

මූලාශ්‍රය : පර්යේෂණ ප්‍රතිඵල දත්ත

විවාහක අංක 01 වශයෙන් ද, අවිවාහක අංක 02 වශයෙන් ද, සංකේත කර ඇත. ඉහත වගුව අනුව නියැදි ජනගහනයේ 68% විවාහක පුද්ගලයන් ද, 32% අවිවාහක පුද්ගලයින්ද වේ. මෙහි නිරූපන අගයන් වන මාතය 1 ද, මධ්‍යයස්ථය 1.1 ක්ද, මධ්‍යන්‍ය 1.32 වේ.

රූපය 2: විවාහක අවිවාහක බව



මූලාශ්‍රය : පර්යේෂණ ප්‍රතිඵල දත්ත

III. වයස

වගුව 03: වයස

සංකේත අංක Valid	සංඛ්‍යාතය Frequency	ප්‍රතිශතය Percent	වලංගු ප්‍රතිශතය Valid Percent	සමුච්චිත ප්‍රතිශතය Cumulative Percent

N Valid	25
Missing	0

01	12	48.0	48.0	48.0		Mean	1.52
02	13	52.0	52.0	100.0		Median	2.00
Total	25	100.0	100.0			Mode	2.

මූලාශ්‍රය: පර්යේෂණ ප්‍රතිඵල දත්ත

වයස අවුරුදු 20-40 අතර සංකේත අංක 01 වශයෙන්ද, 40-60 අතර සංකේත අංක 02 වශයෙන්ද, ලකුණු කර ඇත. ඉහත විශ්ලේෂණයට අනුව 48% ක් වයස අවුරුදු 20-30 අතර පුද්ගලයන්ද 52% ක් වයස අවු. 40-60 අතර පුද්ගලයන් මේ අනුව මාතය 02 ක් ද මධ්‍යනය 1.52 වන නිසා සහ සම්බන්ධතාවය 3 ට වඩා අඩු අගයෙන් පෙන්වා ඇත. මෙම තොරතුරු ප්‍රස්තාරයක් මඟින් පහතින් පෙන්වා ඇත.

රූපය 3: වයස



මූලාශ්‍රය: පර්යේෂණ ප්‍රතිඵල දත්ත

IV. සේවා කාලය

වගුව 04: සේවා කාලය

සංකේත අංක	සංඛ්‍යාතය Frequency	ප්‍රතිශතය Percent	වලංගු ප්‍රතිශතය Valid Percent	සමුච්චිත ප්‍රතිශතය Cumulative Percent		N Valid	25
01	9	36.0	36.0	36.0		Missing	0
02	7	28.0	28.0	64.0		Mean	2.00
03	9	36.0	36.0	100.0		Median	2.00
Total	25	100	100.0			Mode	1

මූලාශ්‍රය: පර්යේෂණ ප්‍රතිඵල දත්ත

සේවා කාලය කාණ්ඩ 03 ක් යටතේ විමසා ඇත. එනම් අංක 01 - අවුරුදු 01-10 අතර ද, අංක 02 අවුරුදු 11-20 අතර ද, අංක 03 අවුරුදු 21-30 ට වශයෙන් තොරතුරු ලැබී ඇත. ඉහත වගුව අනුව 36% සේවා කාලය අවුරුදු 1-10 අතර ද, 28% අවුරුදු 11-20 ත් අතර ද, 36% අවුරුදු 21-30 හෝ ඊට වැඩි වශයෙන් ද නියැඳිය සමන්විත බව තහවුරු කර ඇත. මෙහි මධ්‍යනය හා මධ්‍යස්ථය 02 වන අතර මාතය 1 බවද තහවුරු වී ඇත. මෙහි දී සියළුම දත්ත වලංගු බවද තහවුරු කර ඇත. මෙම තොරතුරු ප්‍රස්තාරයකින් පහතින් පෙන්වා දී ඇත.

රූපය 4: සේවා කාලය



මූලාශ්‍රය: පර්යේෂණ ප්‍රතිඵල දත්ත

V. මාසික ආදායම

වගුව 05: මාසික ආදායම

සංකේත අංක Valid	සංඛ්‍යාතය Frequency	ප්‍රතිශතය Percent	වලංගු ප්‍රතිශතය Valid Percent	සමුච්චිත ප්‍රතිශතය Cumulative Percent
01	13	52.00	52.00	52.0
02	12	48.00	48.00	100.0
Total	25	100.00	100.00	

N Valid	25
Missing	0
Mean	1.48
Median	1.00
Mode	1.

මූලාශ්‍රය: පර්යේෂණ ප්‍රතිඵල දත්ත

මාසික රු. 25,000 සීමාව අංක 01 මඟින්ද, රු. 25,000 ට වැඩි අංක 02 මඟින් ද නම් කර ඇත. මේ අනුව මාසික ආදායම රු. 25,000 අඩු පුද්ගලයන් 13 ක් ද එහි ප්‍රතිශතය 52% කි. රු. 25,000 වැඩි මාසික ආදායම ඇති පුද්ගල සංඛ්‍යාව 12 කි. එහි ප්‍රතිශතය 48% බව අනාවරණය වී ඇත. මෙම සංඛ්‍යා ව්‍යාප්තියේ මාතය 01 ක්ද මධ්‍යස්ථය 1.00 ක්ද මධ්‍යන්‍ය 1.48 ක් ද වශයෙන් පෙන්වා ඇත. මෙම තොරතුරු අනුව සහ සම්බන්ධතාවය 3 ට පහල මට්ටමක පවතින බව අනාවරණය වේ. එම නිසා දත්තවල විශ්වාසනීයභාවය රැඳී පවතින බව තහවුරු වේ. එය ප්‍රස්ථාරිකව නිරූපණය කළ පසු පහත පරිදි වේ.

රූපය 4: මාසික ආදායම



මූලාශ්‍රය: පර්යේෂණ ප්‍රතිඵල දත්ත

ණය තක්සේරු ක්‍රියාවලිය (ආයතනයේ ණය ප්‍රතිපත්ති)

මේ සම්බන්ධව තොරතුරු ලබා ගැනීම සඳහා B-1 සිට B-9 දක්වා ප්‍රශ්න ඉදිරිපත් කරන ලදි. එම තොරතුරු ඇසුරින් crobach's Alpha අගය 0.7 වැඩි බව පහත වගුව මඟින් සනාථ කර ඇත. එම අගය 0.877 ලැබී ඇත. මේ අනුව පෙනී යන්නේ ආයතනයේ ණය ප්‍රතිශතය හෙවත් ණය තක්සේරු ක්‍රියාවලිය නිවැරදි නොවන බවයි.

වගුව 06: ණය තක්සේරු ක්‍රියාවලිය

අංක No	මාධ්‍යනය Mean	සම්මත අපගමනය Std. Dviation	සාමාන්‍යය N
B_1	2.40	1.384	25
B_2	2.00	1.118	25
B_3	2.12	1.013	25
B_4	4.2	0.500	25
B_5	2.08	0.909	25
B_6	1.68	0.852	25
B_7	1.76	0.683	25
B_8	2.32	1.376	25
B_9	2.40	1.291	25

Cronbach's Alpha	No of Items
0.877	9

මූලාශ්‍රය : පර්යේෂණ ප්‍රතිඵල දත්ත

ඉහත වගුව අනුව Cronbach's Alpha අගය 0.7 ට වැඩි බව අනාවරණය වේ. B1 සිට B9 දක්වා ප්‍රශ්න වලින් තහවුරු කරගෙන ඇත්තේ ණය තක්සේරු ක්‍රියාවලිය නැතිනම් ණය ප්‍රතිපත්තිවල ඇති දුර්වලතාවයෙන් හඳුනාගැනීමයි. එම නිසා ආයතනයේ ණය තක්සේරු ක්‍රියාවලිය එනම් ණය ප්‍රතිපත්තිවල දුර්වලතාවයන් පවතින බවයි. මෙම ප්‍රශ්න 09 ගත්විට එක් එක් පුද්ගලයා විසින් ලබා දුන් පිළිතුරු අනුව මධ්‍යනය අගය 3 වේ. එය පහල අගයක් නිසා දත්තවල විශ්වාසනීයභාවය හොඳ මට්ටමක පවතින බවද අනාවරණය වේ. එමෙන්ම, C1 සිට C11 දක්වා ප්‍රශ්නවලින් තහවුරු කරගැනීමට උත්සාහ කර ඇත්තේ ආයතනයේ මූල්‍ය තිරසාරභාවය සම්බන්ධවයි. ඒ අනුව පහත සඳහන් වගුව මඟින් එම දත්ත විශ්ලේෂණය කර ඇත.

වගුව 07: මූල්‍ය තිරසාරභාවය

අංක No	මාධ්‍යනය Mean	සම්මත අපගමනය Std. Dviation	සාමාන්‍යය N
C_1	4.36	.490	25
C_2	4.44	.507	25
C_3	4.08	.862	25
C_4	3.56	1.583	25
C_5	2.16	1.106	25
C_6	2.32	.988	25
C_7	2.64	1.287	25
C_8	1.80	.913	25
C_9	2.20	.866	25
C_{10}	1.88	.927	25
C_{11}	1.96	1.338	25

Cronbach's Alpha	No of Items
0.621	11

මූලාශ්‍රය : පර්යේෂණ ප්‍රතිඵල දත්ත

ඉහත වගුව අනුව Cronbach's Alpha අගය 0.621 කි. එය 0.7 ට වඩා අඩු බව අනාවරණය වේ. ඒ අනුව ආයතනයේ මූල්‍ය තිරසාරභාවයට ගැටළුවක් තිබෙන බව පැහැදිලි වේ.

වගුව 08: - ණය තක්සේරු ක්‍රියාවලිය

අංක No	මාධ්‍යනය Mean	සම්මත අපගමනය Std. Dviation	සාමාන්‍යය N
D_1	2.24	0.879	25
D_2	1.76	0.723	25
D_3	1.80	0.816	25
D_4	1.76	0.926	25

Cronbach's Alpha	No of Items
0.724	4

මූලාශ්‍රය : පර්යේෂණ ප්‍රතිඵල දත්ත

මෙම වගුව මඟින් පැහැදිලි වෙන්නේ ආයතනයේ ණය තක්සේරු ක්‍රියාවලියේ ගැටළු නිසා මූල්‍ය තිරසාරභාවයට බලපෑමක් තිබෙන බවයි. Cronbach's Alpha අගය 0.7 ට වඩා වැඩිවීම තුළින් තවදුරටත් තහවුරු වන බවයි.

අංක No	මාධ්‍යනා Mean	සම්මත අපගමනය Std. Dviation	සාමාන්‍යය N
B	2.3289	0.74775	25
C	1.8900	0.62115	25

සහසම්බන්ධතාවය (Correlations)

		B	D
B	Pearson Correlation	1	.717
	Sig (2-tailed)	-	.000
	N	25	25
C	Pearson Correlation	.717	1.
	Sig.(2-tailed)	.000	
	N	25	25

Correlation is significant at the 0.01 level (2-tailed)

B හා C මධ්‍යය පිළිවෙලින් 2.3289 සහ 1.8900 මේ අනුව ලකුණු වල මධ්‍යනය 3 නිසා C ස්වායත්ත විචල්‍යය සහ පරායත්ත විචල්‍යය වෙන වෙනම ගත්විට මධ්‍යනය 3 පහල මට්ටමක පවතී. එම නිසා දත්තවල විශ්වාසනීය බව තහවුරු වී ඇත. එනම් ණය තක්සේරු ක්‍රියාවලිය සහ මූල්‍ය තිරසාරභාවය අතර සහ සම්බන්ධතාවයක් ඇති බව ඉහත දෙවන වගුව මඟින් තහවුරු කර ඇත.

Descriptive Statistics

අංක No	මාධ්‍යනා Mean	සම්මත අපගමනය Std. Dviation	සාමාන්‍යය N
C	2.8545	.47383	25
D	1.8900	.62115	25

සහසම්බන්ධතාය (Correlations)

		B	D
C	Pearson Correlation	1	.717
	Sig (2-tailed)	-	.000
	N	25	25
D	Pearson Correlation	.683	1

	Sig.(2-tailed)	000	
	N	25	25

Correlation is significant at the 0.01 level (2-tailed)

ඉහතින් සඳහන් කර ඇති B හා D අතර සහ සම්බන්ධතාවය මෙන්ම C හා D අතර සහ සම්බන්ධතාවයක් ඇත. එම නිසා ණය තක්සේරු ක්‍රියාවලිය සහ ණය අකාර්යවීම අතර ඇති සම්බන්ධතාවය ආයතනයේ මූල්‍ය තිරසාරභාවයට බලපෑමක් සිදුකර ඇති බව ඉහත දත්ත විශ්ලේෂණය අනුව තහවුරු වේ.

Descriptive Statistics

අංක No	මාධ්‍යන්‍ය Mean	සම්මත අපගමනය Std. Dviation	සාමාන්‍යය N
B	2.3289	.74775	25
C	2.8545	.47383	25
D	1.8900	.62115	25

Correlations

		B	C	D
B	Pearson Correlation	1	.717	.717
	Sig (2-tailed)	-	.000	.000
	N	25	25	25
C	Pearson Correlation	.877	1	.683
	Sig.(2-tailed)	.000		.000
	N	25	25	25
D	Pearson Correlation	.717	.683	1
	Sig.(2-tailed)	.000	.000	
	N	25	25	25

Correlation is significant at the 0.01 level (2-tailed)

ඉහත විශ්ලේෂණයට අනුව ණය තක්සේරු ක්‍රියාවලිය නැතිනම් ණය ප්‍රතිපත්ති සහ ණය අකාර්යවීම, මූල්‍ය තිරසාරභාවය යන විචල්‍යයන් 03 අතර මනා සහසම්බන්ධතාවයක් ඇති බව මධ්‍යනය හා සම්මත අපගමනය අධ්‍යයනය කිරීමේදී සාධනය වේ. B හා D අතර සහ C හා D අතර සහ සම්බන්ධතාවය තවදුරටත් ප්‍රතිපායතන රේඛා මඟින් සාධනය වන බව අනාවරණය විය. එම ප්‍රතිපායන රේඛා වමේ සිට දකුණට 90^0 ආසන්න ආනතියක් පෙන්වීම හා එම රේඛා දෙපස ඇති අනෙකුත් ලක්ෂ විසිරී ඇති ආකාරය සැලකීමේ දී ප්‍රතිපායන රේඛාව මඟින් පර්යේෂණය සඳහා ලබාගෙන ඇති දත්තවල විශ්වාසනීයභාවය ඉතා ඉහල මට්ටමක පවතී. ඉහත දත්ත විශ්ලේෂණය මඟින් සංකල්පනාත්මක රාමුව මඟින් ගොඩ නගා ඇති උපන්‍යාසයන් එනම් ණය තක්සේරු ක්‍රියාවලිය නිවරදි නොවන නිසා එය ණය අකාර්ය වීමට සෘජුවම බලපෑමක් ඇති වන බවත්, එම නිසා, අහිතකර ණය ප්‍රතිශතය වැඩිවීම නිසා පොලී

ආදායම අඩුවීම තුළින් මූල්‍ය තිරසාරභාවය එනම් කාරක ප්‍රාග්ධනය ඌණ වීම සහ ද්‍රවශීලතාවයට බලපෑමක් කරන බවත් තහවුරු විය.

5. නිගමන හා නිර්දේශයන්

මෙම පර්යේෂණය සිදුකරනු ලැබුවේ සමුපකාර සමිතිවල ක්‍රියාත්මක ග්‍රාමීය බැංකු අංශයේ ණය අකාර්ය වීම නැතිනම් ණය කල්පසු වීම ගැටළුව විමසීම සඳහායි. මේ අනුව, මීට පෙර විද්වතුන් විසින් සිදුකර ඇති පර්යේෂණයන් සහ ඒ සම්බන්ධව ලියවුනු පොත්, සඟරා, ලිපි ආදිය මඟින් සාහිත්‍යමය කරුණු අධ්‍යයනය කරමින් පර්යේෂණ ක්‍රමවේදවලට අනුකූලව පර්යේෂණය සිදුකර එසේ ලැබුණු දත්ත මීට පෙර සිදුකර ඇති පර්යේෂණ සමඟ සන්සන්දනය කරමින් අධ්‍යනය සිදුකර ඇත. මෙහිදි, සමුපකාර ග්‍රාමීය බැංකු සඳහා වෙනත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල බලපෑම සහ එම ක්ෂුද්‍ර මූල්‍ය සමාගම්වල ණය අකාර්ය වීම, අවම වීම පිළිබඳව විවේචනාත්මකව කරුණු විමර්ශනය කර ඇත. සමුපකාර ග්‍රාමීය බැංකුවල ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රියාත්මක වීමේ දී අනුගමනය කරන ක්‍රමවේදයන් සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණ මඟින් කරුණු අධ්‍යයනය කර තොරතුරු රැස්කරගෙන ඒ අනුව පර්යේෂණ ගැටළුවට හේතු විමර්ශනය කර ඇත. මෙහිදී, ග්‍රාමීය බැංකු ශාඛාවල ණය අකාර්ය වීම සීග්‍රයෙන් වැඩි වීම නිසා වෙනත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල අකාර්ය ණය අවම වීම පිළිබඳව කරුණු අධ්‍යනය කර ඇති බවද සඳහන් කරන අතර, විශේෂයෙන් සමුපකාර සමිති ප්‍රජා මූලික සංවිධානයක් වශයෙන් කටයුතු කිරීමේ දි එහි නියාමනය සහ නායකත්වය සම්බන්ධව ද ගැටළු ඇති බව නිගමනය කෙරේ. සමුපකාර ව්‍යාපාරයට විශේෂයෙන්ම එහි නායකත්වය හා නියාමන ව්‍යුහය, ප්‍රතිපත්ති සැකසීමේදී අවධානය යොමුකල යුතු අංශ කිහිපයක් පහතින් සටහන් කර ඇත. කෙසේ වෙතත් මෙම පර්යේෂණය පමණක් ණය ප්‍රතිපත්ති නැතිනම් ණය තක්සේරු ක්‍රියාවලිය සකස් කිරීමට ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කරන අතර වෙනත් පුළුල් පරාසයක් පදනම් කරගෙන පර්යේෂණයක් සිදුකර එහි නිගමන හා නිර්දේශයන් පිළිබඳව සහාය ලබාගෙන මධ්‍යම පළාත තුළ ක්‍රියාත්මක නෛතික භාවයක් ඇති ණය ප්‍රතිපත්ති සකස් කර යුතු බව අවසාන වශයෙන් නිගමනය කරයි.

නිර්දේශයන්

ණය අවශ්‍යතාවය අනුව ණය වර්ග කල යුතුය. උදාහරණ වශයෙන් පාරිභෝගික ණය, ව්‍යාපාරික ණය, නිවාස ණය ලෙස දැක්විය හැකිය. ණය ආපසු ගෙවන කාලය අනුව ද ණය වර්ග කිරීම වැදගත් වේ. එනම්, කෙටි කාලීන ණය වසර 01 සිට 03 දක්වා, මධ්‍ය කාලීන ණය වසර 03 සිට 05 දක්වා, දීර්ඝ කාලීන ණය වසර 05 ට වැඩි. මේ සඳහා උපරිම කාලය නිර්ණය කල යුතුය. එමෙන්ම, ණය නිකුත් කිරීමේ පියවරයන් තීරණය කල යුතුයි. එනම්, ප්‍රජාව මුණගැසී ණය අවශ්‍යතාවයන් හඳුනාගෙන ඒ සඳහා සුදුසු ණය ක්‍රම සකස්කර ගත යුතුයි. ඒ අනුව ණයලාභීන් හඳුනාගැනීම. එමඟින් අවශ්‍ය පුද්ගලයන්ට අවශ්‍යතාවය අනුව ණය ප්‍රදානය කිරීමට නිර්දේශ කරයි. ණය නිකුත් කිරීමට පෙර ණයකරු පිළිබඳ තොරතුරු අධ්‍යනය කිරීමේ ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. ණය කරුවන් විසින් ණය අවශ්‍යතාවය වෙනුවෙන් සකස් කර ලබාදෙන ව්‍යාපෘති වාර්තාවන් අධ්‍යනය කර නිර්දේශ ඉදිරිපත් කල

හැකි ණය නිලධාරීන්ගේ සංචිතයක් ඇති කර ගත යුතුයි. ණය ලාභීන්ගේ මූල්‍ය තත්වය විශ්ලේෂණය මඟින් ණය වාරික අයකරගත හැකි බවට තීරණය කිරීමට අවශ්‍ය සංඛ්‍යාත්මක තොරතුරු ලබාගත හැකි ක්‍රමවේදයක් සකස් කර ගත යුතුය. අනුපාත විශ්ලේෂණයක් මඟින් ණය ලාභියා පිළිබඳව නිවරැදි තොරතුරු ලබාගැනීම සඳහා අනුගමනය කල යුතු පියවරයන් තීරණය කල යුතුය. අනෙක් අතට පෙර විපරම් හා පසු විපරම් ක්‍රියාවලිය සිදු කිරීමේ දී විශේෂයෙන් සළකා බැලිය යුතු කරුණු සම්බන්ධව නියෝග සකස් කල යුතු බව ද පර්යේෂක නිර්දේශ කරයි.

ආශ්‍රිත මූලාශ්‍ර

කැන්ට්, ඩ., & ඩෙමුැජියාවේ. (1998). ණය චර්යාව. *සමාජ සංවර්ධන ජර්නලය*, 8-12.

ක්‍රිටන්. (1999). ක්ෂුද්‍රමූල්‍යය ණය වර්ගීකරණය. *ක්ෂුද්‍ර මූල්‍ය ණය විග්‍රහය*, 89-92.

ජයමහ, ආ., & මුලන්. (2010). සමුපකාර ග්‍රාමීය බැංකු සහ මූල්‍ය භාවිතය. *කැලණිය කළමනාකරණ ජනලය*, 32-42.

තිලකරත්න, & වික්‍රමසිංහ. (2019). ක්ෂුද්‍ර මූල්‍ය සහ ග්‍රාමීය බැංකු. *මූල්‍ය හා සමාජවිද්‍යා ජර්නලය*, 22-29.

පැසන්, & ඇල්ටන්. (2001). *බැංකුවල ණය අයකර ගැනීම*. නිව්යෝර්ක්: නිව්යෝර්ක් ප්‍රින්ටින් ඇන්ඩ් ප්‍රෙස්.

බර්ගර්, & ඩියුං. (1997). අප්‍රිකානු රටවල ක්ෂුද්‍ර මූල්‍ය ණය. *මූල්‍යය හා කළමනාකරණ විවරණය*, 2-12.

බුලත්ගම, අ. (2014). *සමුපකාරයට ප්‍රවේශයක්*. මහනුවර: ජාතික සමුපකාර සංවර්ධන ආයතනය.

රත්නසීල. (2018). සමුපකාර බැංකු ණය. *සමුපකාර සංවර්ධන සඟරාව*, 8-12.

රාජන්. (1994). බැංකුවල මූල්‍ය ශක්තිය හීනවීම නිසා කාර්ය සාධනය අඩුවීම සහ අලාභත්වයට පත් වීම. *කළමනාකරණ ජර්නලය*, 21-32.

වීරසේකර. (2020). සාර්ව ආර්ථික සාධක බැංකු ණය කෙරෙහි ඇති කරන බලපෑම. *ආර්ථික විවරණය*, 15-21.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව. (2018). *සංඛ්‍යාන වාර්තාව*. කොළඹ: සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

සොනාලි. (2001). ණය පැහැර හැරීම සම්බන්ධ හේතු අධ්‍යනය. *ගිණුම් හා මූල්‍ය ජර්නලය*, 45-52.